**ජනාධිපතිවරයාගේ අරමුදල - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජනාධිපතිවරයාගේ අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනත, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිත අංක 01 හි 71 ඡේදය ප්‍රකාරව අයකර ගතයුතු වත්කම් ජංගම හා ජංගම නොවන ලෙස හෙළිදරව් කළ යුතුව තිබුණි. අරමුදල වෙත ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් අයවීමට තිබෙන රු. මිලියන 129 කින් ඉදිරි මාස 12ක කාලසීමාව තුළ අයකර ගත යුතු රු. මිලියන 12 ක් ජංගම වත්කම් ලෙස සහ ඉතිරි රු. මිලියන 117 ක් ජංගම නොවන වත්කම් ලෙස වෙන්කර දක්වනවා වෙනුවට මුළු ලැබිය යුතු මුදලම ජංගම වත්කම් ලෙස දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ සිට නිවැරදිව දැක්වීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් යටතේ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සිදු කර තිබුණු රු.2,200,000 ක ආයෝජන දක්වා තිබුණි. එම ආයෝජන අගය කිරීමේ පදනම ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් හෙළිදරව් කර නොතිබුණි. | ජනාධිපති අරමුදලේ මූල්‍ය පදනම ශක්තිමත් කිරීමේ අරමුණින් ජනාධිපති අරමුදල සහ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් සම සමව එනම් රු. 2,200,000.00 බැගින් ආයෝජනය කරමින් 1983 වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්ථාපනය කරන ලදී. 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 11 (1) (ආ) සහ 17 (5) වගන්ති වල ජනාධිපති අරමුදලට සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් මුදල් බැර කල යුතු බව සඳහන් වේ. ඒ අනුව සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් මාසිකව සිය ලාභාංශ ජනාධිපති අරමුදලට පරිත්‍යාග කරයි. | අදාළ හෙළිදරව් කිරීම් ගිණුම්කරණ ප්‍රතිපත්ති තුළ ඇතුළත් කිරීම කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ශිෂ්‍යත්ව විභාගය සමත් සිසුවියක් වෙනුවෙන් අරමුදලින් රු.300,000 ක ස්ථාවර තැන්පතු ගිණුමක් විවෘත කර එමඟින් ලබන පොළිය මාසයකට රු.1,500 ක උපරිමයකට යටත්ව සිසුවියගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ඇයට වයස අවුරුදු 18 ක් සම්පූර්ණ වන තෙක් ගෙවන ලෙස බැංකුවට උපදෙස් ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් එම ස්ථාවර තැන්පතුවෙන් රු. 26,908 ක පොළියක් ලැබී තිබුණු අතර, එම සම්පූර්ණ පොළියම සිසුවියට බැංකුව විසින් ගෙවා තිබුණි. බැංකුවට ලබා දී තිබුණු උපදෙස් අනුව එම සිසුවියට සමාලෝචිත වර්ෂය සඳහා රු. 18,000 ක් ගෙවිය යුතුව තිබුණත්, එම සීමාව රු.8,908 කින් ඉක්මවා | මෙම ස්ථාවර තැන්පතුව මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීම මගහැරී ඇති අතර 2021 වර්ෂයේදී එය නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. මෙම තැන්පතුවේ පොලිය සෘජුවම ප්‍රතිලාභියාගේ බැංකු ගිණුම වෙත බැර කෙරෙන බැවින් එය ජනාධිපති අරමුදලේ පොලී ආදායමක් වශයෙන්ද අනතුරුව ශිෂ්‍යාධාර වියදමක් ලෙසද හඳුනා නොගනී. | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.26,908 ක් ගෙවා තිබුණි. තවද, අරමුදල නමින් පැවති එම ස්ථාවර තැන්පතුව අරමුදලේ වත්කමක් ලෙසත් සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම රු. 26,908 ක් ආදායමක් ලෙස හා ඉන් සිදුකළ ගෙවීම වියදමක් ලෙසත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ විදේශ රෝහලකදී සිදු කළ වෛද්‍ය ප්‍රතිකාර වියදම් පියවීම සඳහා අරමුදලේ වියදමක් ලෙස ගිණුම්ගත කර නිකුත් කරන ලද රු. 6,083,244 ක් වූ චෙක්පත 2021 දෙසැම්බර් 15 දින වන විටත් ලේකම්, විදේශ සබඳතා කාර්යාලය වෙත නිකුත් කර නොතිබුණි. එම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී වෛද්‍යාධාර වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම චෙක්පතට අදාල ගොණුවෙහි කටයුතු සම්පූර්ණ කළ පසු චෙක්පත නිකුත් කිරීමට කටයුතු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීම කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි, කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනතේ 6 වන වගන්තිය | අරමුදලට අයත් මුදල්, මණ්ඩලය විසින් නිශ්චය කර ජනාධිපතිවරයාගේ විධානයට අනුව ගෙවිය යුතුව තිබුණත්, 2019 ඔක්තෝබර් මාසයේ සිට දෙසැම්බර් 31 දින දක්වා වැය කර තිබුණු එකතුව රු. 659,287,255 ක් සහ 2020 ජනවාරි 01 දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා වැය කර තිබුණු එකතුව රු. 1,899,195,017 ක් සඳහා 2021 දෙසැම්බර් 15 දින වන විටත් මණ්ඩලය විසින් නිශ්චය කර නොතිබුණි. | 2019 ඔක්තෝබර් 01 දින සිට 2019 දෙසැම්බර් 31 දක්වා සහ 2020 ජනවාරි 01 දින සිට 2020 දෙසැම්බර් 31 දක්වා ජනාධිපති අරමුදලේ සිදු කරනු ලැබූ සියළුම ගෙවීම් අතිගරු ජනාධිපතිතුමන්ගේ අනුමැතිය ලබා ගෙන සිදු කර ඇත. 2019.10.18 දිනෙන් පසුව ජනාධිපති අරමුදලේ පාලක මණ්ඩල රැස්වීමක් නොපැවැත්වුන අතර පවතින කොවිඩ් වසංගත තත්ත්වය යටතේ පාලක මණ්ඩල රැස්වීම පැවැත්වීම සඳහා දිනයක් නියම කිරීම අපහසු වී ඇත. ඉදිරියේ දී පැවැත්වෙන පාලක මණ්ඩල රැස්වීමේදී මෙම කාල සීමාවට | පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අදාලව අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 396 | 2021 ඔක්තෝබර් මාසය වෙනුවෙන් පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව 2020 මාර්තු 12 දින සිට 2020 නොවැම්බර් 11 දින දක්වා එකතුව රු.11,507,044 ක් වූ නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් 12 ක් පැවැතුණි. එම චෙක්පත් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව 2021 ඔක්තෝබර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂය තුල මෙම චෙක්පත් සම්බන්ධයෙන් මු. රෙ. 396 අනුව කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 ජූලි 26 දිනැති අංක 03/2018 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය | අරමුදල මඟින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන අංක 51204 (46078) දරන බැංකු ගිණුම 2020 හා 2021 වර්ෂයන්හිදී අක්‍රීය තත්ත්වයේ පැවති අතර, ඒ සම්බන්ධයෙන් අරමුදල විසින් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අතිගරු ජනාධිපතිතුමා විසින් නියම කරනු ලබන විශේෂ ව්‍යාපෘති සම්බන්ධයෙන් අරමුදල් රැස් කිරීම සහ ගෙවීම් සිදු කිරීම වැනි විශේෂ අවස්ථාවන්හි දී භාවිතා කිරීම සඳහා 51204 අංක දරන ගිණුම පවත්වාගෙන යනු ලබයි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

---

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,338,345,661 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 615,388,704 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 722,956,957 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව ආදායම් රු. 270,753,303 කින් වැඩිවීම සහ වියදම් රු. 451,475,888 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් වෛද්‍යාධාර ගෙවීම් සඳහා එකතුව රු. මිලියන 331 ක් වැය කර තිබුණ අතර, ඉකුත් වර්ෂයේදී ඒ සඳහා රු. මිලියන 1,019 ක් වැයකර තිබුණි. ඒ අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වෛද්‍යාධාර ගෙවීම රු. මිලියන 688 කින් හෙවත් සියයට 68 කින් අඩු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී හෘද සැත්කම්, පිළිකා රෝග, මොළය ආශ්‍රිත රෝග, දණහිස් හා උකුළ ආශ්‍රිත රෝග, වකුගඩු රෝග සහ වෙනත් ප්‍රතිකාර සඳහා රෝගීන් 5407 දෙනෙකු වෛද්‍යාධාර වශයෙන් ඉල්ලීම් කර තිබුණු නමුත්, රෝගීන් 1914 දෙනෙකු සඳහා පමණක් වෛද්‍යාධාර ගෙවීම් කර තිබුණි. ඉකුත් වර්ෂයේදී වෛද්‍යාධාර වශයෙන් රෝගීන් 6386 දෙනෙකු සඳහා ගෙවීම් කර තිබුණි. ඒ අනුව, ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී වෛද්‍යාධාර ගෙවූ රෝගීන් සංඛ්‍යාව 4472 කින් හෙවත් සියයට 70 කින් අඩු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වෛද්‍යාධාර ගෙවීම් අනුමත කර රෝගීන් විසින් බිල්පත් ඉදිරිපත් කර තිබුණද, ලිපිගොනු සම්බන්ධව ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය වන තොරතුරු ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් අපොහොසත් වීම හෝ ප්‍රමාද වීම සහ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් වර්ෂ 1 ක සිට වර්ෂ 2 මාස 3 ක් දක්වා කාල පමාවකින් පසුව එකතුව රු.3,364,482 ක් සමාලෝචිත වර්ෂයේදී රෝගීන් 23 දෙනෙකු වෙත වෛද්‍යාධාර ගෙවා තිබුණි. | ලිපිගොණු සම්බන්ධව ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය වන තොරතුරු එනම්, වැටුප් වාර්තා, බැංකු ගිණුම් විස්තර ආදිය ඉල්ලා සිටින අවස්ථාවලදී එම තොරතුරු ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් අපොහොසත් වීම හෝ ප්‍රමාද වීම හේතුවෙන් ගෙවීම් කටයුතු ප්‍රමාද වී ඇත. එසේම 2020 වර්ෂයේ මාර්තු මාසයේ සිට පවත්නා කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අවස්ථා කිහිපයකදීම කාර්යාලය වසා තැබීම සහ අවම කාර්ය මණ්ඩලයකින් කාර්යාලීය කටයුතු පවත්වාගෙන යාමද මෙයට හේතු වී ඇත. | වෛද්‍යාධාර ගෙවීම් කඩිනම් කිරීම කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට රෝගීන් 23 දෙනෙකු වෙත එකතුව රු.3,774,000 ක වෛද්‍යාධාර ගෙවීම් අරමුදල විසින් අනුමත කර තිබුණු අතර, රෝගීන් විසින් ඒ සඳහා වෛද්‍ය බිල්පත් ද ඉදිරිපත් කර තිබුණි. රෝගීන් විසින් ඉදිරිපත් කර තිබුණු බැංකු ගිණුම් අංක ඇතුළත් විස්තර ඔවුන්ගේ ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති විස්තර සමඟ නොගැළපීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ගෙවීම් කිරීමට නොහැකි වී තිබුණි. | ජනාධිපති අරමුදල මගින් වෛද්‍යාධාර ලබා දීමේ දී කුටුම්භයේ ආදායම සලකා බැලෙන අතර ඒ සඳහා රෝගියා ඇතුළු පවුලේ සාමාජිකයන්ගේ සියළු බැංකු ගිණුම් විස්තර පරීක්ෂා කරනු ලබයි. එහිදී රෝගියා විසින් ගෙවීම් සඳහා ඉදිරිපත් කරන බැංකු ගිණුම අයදුම්පතෙහි සඳහන් කර ඇති විස්තර සමඟ නොගැලපෙන අවස්ථාවලදී නැවත බැංකු ගිණුම් විස්තර පරීක්ෂා කෙරේ. | වෛද්‍යාධාර ගෙවීම් කඩිනම් කිරීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුළු වෛද්‍යාධාර වටිනාකම රු.8,125,522 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේදී එය රු.59,194,859 ක් විය. ඒ අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අරමුදලෙන් ගෙවිය යුතු මුළු වෛද්‍යාධාර වටිනාකම සියයට 629 කින් වැඩි වී තිබුණි. | ලිපිගොණු සම්බන්ධව ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය වන තොරතුරු එනම්, වැටුප් වාර්තා, බැංකු ගිණුම් විස්තර ආදිය ඉල්ලා සිටින අවස්ථාවලදී එම තොරතුරු ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් අපොහොසත් වීම හෝ ප්‍රමාද වීම හේතුවෙන් ගෙවීම් කටයුතු ප්‍රමාද වී ඇත. එසේම 2020 වර්ෂයේ මාර්තු මාසයේ සිට පවත්නා කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අවස්ථා කිහිපයකදීම කාර්යාලය වසා තැබීම සහ අවම කාර්ය මණ්ඩලයකින් කාර්යාලීය කටයුතු පවත්වාගෙන යාමද මෙයට හේතු වී ඇත. | වෛද්‍යාධාර ගෙවීම් කඩිනම් කිරීම කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා එකතුව රු.මිලියන 21.25 ක අපේක්ෂිත වියදම් සහිත ක්‍රියාකාරකම් 09 ක් සිදු කිරීමට අදාල ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, අත්පත් කර ගත් ප්‍රගතිය සඳහන් වන වාර්ෂික කාර්යසාධන වාර්තාව 2021 දෙසැම්බර් 15 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. | ජනාධිපති කාර්යාලයේ වාර්ෂික කාර්යසාධන වාර්තාවට ඇතුළත් කර ඇත. | ප්‍රගතිය සඳහන් වන වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුය. |
| (ඉ) | සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 11(ආ) වගන්තිය ප්‍රකාරව ලොතරැයි පැවැත්වීමෙන් ලැබෙන මුදලින්, ලොතරැයි මණ්ඩලයේ වියදම් කළ පසු ඉතිරිය ජනාධිපතිවරයාගේ අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතුව තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂයට අදාළව රු.685,860,083 ක් සංවර්ධන ලොතරැයි මණ්ඩලය වෙතින් මුදල් ප්‍රේෂණය කර ගැනීමේදී දින 20 ක සිට දින 287 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයන් නිරීක්ෂණය විය. | අවසාන සංඛ්‍යාත්මක නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමෙන් පසු වර්ෂයට අදාල අවසාන මුදල ප්‍රේෂණය කර ඇත. | අරමුදල් අප්‍රමාදව ලබාගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 නොවැම්බර් මාසයේදී අරමුදලට වසර 40 ක් පිරීම නිමිත්තෙන් පාලක මණ්ඩලය විසින් දුෂ්කර හා අඩු පහසුකම් සහිත තෝරාගත් රජයේ | ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස සිදුකළ රු. 90,706,000 ක ගෙවීම සහ ඊට අදාළ ප්‍රගතිය ඉදිරියේදී පැවැත්වීමට නියමිත පාලක | විශේෂ ව්‍යාපෘති කඩිනම් කිරීම කළ යුතුය. |

රෝහල් 12 ක් වෙනුවෙන් රු. මිලියන 437.81 ක රෝහල් උපකරණ ලබාදීමට 2019 ඔක්තෝබර් 11 දින විශේෂ ව්‍යාපෘති අනුමත කර තිබුණි. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මිලදීගෙන තිබුණු රු. මිලියන 90.71 ක් වටිනා වෛද්‍ය උපකරණ සඳහා වූ බිල්පත් සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් පියවා තිබුණි. අරමුදලේ 42 වන සංවත්සරය ද එළඹ තිබුණු නමුත් 2021 දෙසැම්බර් 15 දින වන විටත් උක්ත විශේෂ ව්‍යාපෘතියේ ඉතිරි රු. මිලියන 347.1 කට අදාලව වෛද්‍ය උපකරණ මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි.

මණ්ඩලය වෙත ඉදිරිපත් කර ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදුකිරිම සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.